**ජාතික විද්‍යා පදනම - 2020**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මතය**

**---------**

ජාතික විද්‍යා පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික විද්‍යා පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත්

නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

## 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ මාර්ගෝපදේශයේ 5.1 ඡේදය ප්‍රකාරව ප්‍රදානයක අර්ධ වාර්ෂික මූල්‍ය ප්‍රගතිය සෑම වසරකම ජුනි 15 දින හා දෙසැම්බර් 15 දින පදනම වෙත ඉදිරිපත් කිරීමද, නිමකළ පර්යේෂණ ව්‍යාපෘති වල අවසාන මූල්‍ය වාර්තාව සමඟ ඉතිරි මුදල් ව්‍යාපෘතිය නිම වී මාසයක් ඇතුළත පදනම වෙත නැවත පියවීමද සිදුකළ යුතු වුවත් පර්යේෂණ ව්‍යාපෘති 13 ක් සම්බන්ධයෙන් එකතු වටිනාකම රු. 8,282,388 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | පියවීමට ඇති ඉතිරි මුදල් පියවන ලෙස ප්‍රතිලාභීන් දැනුවත් කර ඇත. සිහිකැඳවීම් යවා ඇත. | මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීමෙන් බාහිර පාර්ශවයන් අත ඇති රජයේ ප්‍රදාන වහාම නැවත අයකර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතු වේ. |

**1.5.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර කිහිපයක සිට පැවත එන රු.2,375,175 ක්වූ විගණන ගාස්තු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති රු.2,375,175 ක්වූ විගණන ගාස්තු ගෙවීම සඳහා එකඟතාවය අමාත්‍යාංශය වෙත යවා ඇත. වාර්ෂික ප්‍රතිපාදන ලැබීමෙන් පසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු දෑ ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අංක PED 2/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ජාතික විද්‍යා පදනම විසින් 2018 මැයි මාසයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා වන මාස 32 ක කාලපරාසය තුළ උක්ත චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව දූරකථන දීමනා හිමි නිලධාරීන් 45 දෙනෙකු වෙත එකතු වටිනාකම රු. 6,456,170ක් වූ මුදලක් සන්නිවේදන බිල්පත් වටිනාකම් පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව අනුමත මාසික උපරිම සීමාවම ගෙවා තිබුණි. | ජාතික විද්‍යා පදනම PED 2/2015 චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන් සඳහා සන්නිවේදන දීමනා ගෙවීම 2015/06/01 දින සිට සිදුකර ඇත. එහෙත් බිල්පත් ප්‍රතිපූර්ණය ඉතා සංකීර්ණ වීම හේතුවෙන් 2018 මැයි මස සිට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත සියළු සන්නිවේදන බිල්පත් වෙනුවෙන් අදාළ මාසයේ දී දරන ලද වියදම අදාළ නිලධාරීතුමා / තුමියගෙන් ලිඛිතව සහතික කර ලබාගෙන උපරිම සීමාවට යටත්ව ඉල්ලුම් කරන ලද මුදල, ඊළඟ මසදී ගෙවන ලදි. මෙම ක්‍රමවේදය මතභේදයට ලක්ව ඇති බැවින් මේ වන විට අල්ලස් හා දූෂණ සභාව විසින් විමර්ශනයක් පවත්වාගෙන යන අතර එහි තීරණය මත 2018 මැයි සිට 2020 දෙසැම්බර් දක්වා ගෙවීම් පිළිබඳ ඉදිරි පියවර ගනු ලැබේ.<br>ඒ අතරම 2021 පෙබරවාරි මස සිට ඉහත පරිදි ගෙවීම් කිරීම සම්පූර්ණයෙන්ම නවතා ඇති අතර චක්‍රලේඛයට අනුකූලව ම නිලධාරීන්ගෙන් බිල්පත් ලබාගෙන, එම බිල්පත් | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදය නැවතත් ආරම්භ කර ඇත. | |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගගෝපදේශ සංග්‍රහය | කොන්ත්‍රාත් වටිනාකමින් 5%ක් ගෙවීමේ පදනම මත ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැනීම සඳහා උපදේශකයකුගේ සේවය ලබාගෙන තිබූ අතර ඒ සඳහා උපදේශන ආයතනයක් තෝරා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 ඡේදය හා 6.3.6 ඡේදය | ලංසු විවෘත කිරීමේ කාර්යය ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරි පිටදී සිදුකළ යුතු අතර ලංසු විවෘත කිරීමේ කාර්යයට නිළ වශයෙන් සහභාගි වන සියළු දෙනාම පැමිණීම පිළිබඳව අත්සන් ලබාගත යුතු වුවත් ලංසුකරුවන්ගේ පැමිණීම සනාථ කිරීම සඳහා ලංසු විවෘත කිරීම පිළිබඳ වාර්තා සටහන ලිපිගොනුව තුළ නිරීක්ෂණය නොවුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ඡේදය | මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවත් , උපදේශන සේවා ආයතනය සමඟ ඇතිකර ගත් ගිවිසුමේ ඇමුණුම 03 හි විෂය පථයේ 1 වගන්තිය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුව සැකසීම උපදේශක විසින් සිදුකර තිබුණි. උපදේශකට ගෙවීම් කරනු ලබන්නේ කොන්ත්‍රාත් පිරිවැය පදනම් කරගෙන බැවින් එම කාර්යය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර උපදේශක විසින් ඉටුකරවා | පිළිතුරු ලැබී නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගැනීම විගණනයේදී ගැටළු සහගත විය. | | |
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝප දේශ සංග්‍රහයේ 4.3.2 ඡේදය. | මුළු පිරිවැය ඇස්තමේන්තුව ආයතන ප්‍රධානියා විසින් අනුමත කළ යුතු වුවත් එසේ අනුමත කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 23,467,308 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 26,962,258 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 50,429,566 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් භූමිය සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකින් සේවය ලබාගෙන තිබූ අතර එහිදී ලංසු 04 ක් පමණක් ලැබී තිබුණු අතර 4 වන අවම මිල ඉදිරිපත් කළ අයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. පළමු හා දෙවන මිල ඉදිරිපත් කර ඇති කොන්ත්‍රාත්කරුවන් සුදුසුකම් සපුරා නොමැතිවීම මත ප්‍රතික්ෂේප වී ඇති අතර තෙවන අවම මිල ඉදිරිපත් කළ අයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් පිරිවැය රු.3,134,002 කින් ද උපදේශන ගාස්තුව රු. 156,700 කින් ද ඉහළ ගොස් තිබුණි. | පිළිතුරු ලැබී නැත. | අවම පිරිවැයකින් හා වැඩි කාර්යක්ෂමතාවයන් සහිතව කාර්යයන් සිදුකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2013 ඔක්තෝබර් 04 දින පාලක මණ්ඩල අනුමැතිය ලැබී ඇති භූමිය සකස් කිරීමේ ව්‍යාපෘතිය වසර 06 ක් ප්‍රමාද වී ආරම්භකර තිබුණි. 2013 වර්ෂයේදී මෙම කාර්යයේ ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් වටිනාකම රු.30,480,000ක් වූ අතර 2018 වර්ෂය තුලදීද එම වටිනාකම යටතේම කාර්යය ඉටුකිරීමට පාලක මණ්ඩලය අනුමත කර තිබුණද කාර්යය ඉටුවී නොතිබුණි. 2019 වර්ෂයේ පාලක මණ්ඩලය අනුමත කළ ඇස්තමේන්තු අගය රු. 36,040,000 ක් වූ අතර 2018 වර්ෂය තුළ මෙම කාර්යය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් දැරීමට සිදුවී ඇති අතිරේක ඇස්තමේන්තු ගත වියදම රු.5,560,000 කි. | විගණන විමසුම සඳහා පිළිතුරු ලැබී නොමැත. | අතිරේක පිරිවැයක් අවම කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පදනමේ අනුමත කාර්යය මණ්ඩලය 144 ක් වන අතර පුරප්පාඩු පවතින තනතුරු ගණන 27 ක් විය. එම පුරප්පාඩු තනතුරු වලින් 16 ක් වසර 07 ත් මාස 10 ත් අතර කාල පරාසයක සිට පවතින අතර එම පුරප්පාඩු සඳහා බඳවා ගැනිම් සිදු කිරිමට පදනම විසින් 2021 මාර්තු විගණන දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු වලින් එකක් 2021 බඳවා ගැනීම් සිදුකළ අතර අනෙකුත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් අයදුම් නොකිරීම, ජනාධිපතිවරණය හේතුවෙන් බඳවා ගැනීම් අහෝසි කිරීම, බඳවා ගත් අයදුම්කරුවන් සේවයට නොපැමිණීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය වැනි කරුණු හේතුවෙන් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය. | අවශ්‍ය තනතුරු සඳහා හැකි ඉක්මනින් බඳවා ගැනීම සහ එසේ කිරීමට අපහසුතා තිබේනම් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පදනමේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2020 ජනවාරි 01 දින සිට පුරප්පාඩු වී පවතින අතර එම තනතුර සඳහාද විගණන දිනය වන විටත් බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම සඳහා 2019 හා 2020 දී, අවස්ථා දෙකක දී අයදුම්පත් කැඳවන ලද අතර, පළමු අවස්ථාවේ තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරන අයෙකු නොසිටි අතර දෙවන අවස්ථාවේ තෝරාගත් අයදුම්කරු තනතුර බාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. නැවත වරක්, මෙම තනතුරට බඳවා ගැනීම සඳහා 2021 අගෝස්තු මස අයදුම්පත් කැඳවන ලද අතර, එක් අයදුම්කරුවෙකු පමණක් මේ සඳහා ඉල්ලුම් කර ඇත. සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කළමනාකරණ මණ්ඩලයේ හා අමාත්‍යාංශයේ අනුමැතිය මත සිදු කරනු ලැබේ. | බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව බඳවා ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | පුරප්පාඩුව ඇතිවූ දිනය සඳහන් නොවන වසර කිහිපයක සිට පුරප්පාඩුව පවතින ගිණුම් නිලධාරී හා පොත් බඳින්නා යන තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරිමට විගණන දිනය වන විටත් කටයුතු කර නොතිබුණි | ගිණුම් නිලධාරි තනතුරු 02 සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ නඩුවක් ගොනුකර ඇති අතර එම නඩුව දැනට විභාග වෙමින් පවතී. එම නඩුවේ තීන්දුව අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.<br><br>පොත් බඳින්නා තනතුරු 02 ක් 2014 ට පෙර සිට පුරප්පාඩුව පවතී. මෙම පුරප්පාඩුව පිරවිම සඳහා අවස්ථා ගණනාවකදි අයදුම්පත් කැඳවනු ලැබුවත්, ආයතනයේ බඳවා ගැනිමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් (NVQ 4 සහතිකය ) සපුරා තිබු අයදුම්කරුවන් ඉල්ලුම්කර නොතිබු බැවින් මෙම තනතුරු 02 පිරවිමට නොහැකි වි ඇත. මෙම පුරප්පාඩු 02 පිරවිම සඳහා බඳවා ගැනිමේ පටිපාටිය සංශෝධනය කර ගැනිමට | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

අවශ්‍ය යෝජනා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට දැනටමත් ඉදිරිපත් කර ඇති අතර මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත.